| කොවිඩ්-19 සති පාසල | |
|---|---|
| 2021 - දෙවන සතිය | |
| 10 ශ්‍රේණිය | භූගෝල විද්‍යාව |

## පෘථිවියේ ව්‍යුහය

- පෘථිවි ව්‍යුහය ප්‍රධාන ස්ථර තුනකින් සමන්විත වේ.

1. කබොල → මහද්වීපික කබොල, සාගරික කබොල
2. ප්‍රාවරණය → ඉහල ප්‍රාවරණය, පහල ප්‍රාවරණය
3. හරය → පිටත හරය, ඇතුලත හරය

- පෘථිවි කබොල ප්‍රාවරණයෙන් වෙන් වන සීමාව **මොහොරෝවිසික් අසන්තතිය** නම් වන අතර ප්‍රාවරණය හා හරය වෙන් කරන සීමාව **ගුටෙන්බර්ග් අසන්තතිය** ලෙස හැඳින්වේ.

### පෘථිවි ව්‍යුහයේ ස්ථරවල විශේෂ ලක්ෂණ

| කබොල | ප්‍රාවරණය | හරය |
|---|---|---|
| * පෘථිවි ස්කන්ධයෙන් 1% ක් පමණ වේ.<br>* ඝණකම ඒකාකාරී නැත.<br>* කෘෂිකාර්මික කටයුතුවලට වැදගත් වේ.<br>* මහද්වීපික කබොල - සිලිකා හා ඇලුමිනියම් වලින් යුත් බැවින් සියල් ස්ථරය ලෙස හඳුන්වයි.<br>* සාගරික කබොල - සිලිකා හා මැග්නීසියම් වලින් යුත් බැවින් සිමැග් ස්ථරය ලෙස හඳුන්වයි. | * පෘථිවි ස්කන්ධයෙන් 2/3 ක් පමණ වේ.<br>* ඉහල ප්‍රාවරණය හා පහල ප්‍රාවරණය ලෙස කොටස් දෙකකි.<br>* ඉහල ප්‍රාවරණය - ඔලිවින් හා සිලිකේට් වලින්ද<br>* පහල ප්‍රාවරණය - මැග්නීසියම් හා සිලිකේට් වලින්ද යුක්තය | * ප්‍රාවරණයට පහලින් පිහිටයි.<br>* සංයුතිය අනුව ඇතුලත හරය හා පිටත හරය ලෙස දෙකොටසකි<br>* පිටත හරය - ද්‍රවමය ලෝහවලින්ද (නිකල් සහ යකඩ)<br>* ඇතුලත හරය - ඝන ලෝහ වලින්ද යුක්තය |

- **භූ තැටි**

ශිලාගෝලය විශාල භූ තැටි **හතකින්** හා කුඩා භූ තැටි කිහිපයකින් සමන්විත වේ. මෙම භූ තැටි ප්‍රාවරණය තුළ ක්‍රියාත්මකවන සංවහනධාරාවල බලපෑමෙන් චලනය වේ.

**ක්‍රියාකාරකම**

01. පෘථිවියේ ව්‍යුහය ඇඳ නම් කරන්න

02. පෘථිවි ව්‍යුහයේ ස්ථරයන්හි ලක්ෂණ තුන බැගින් ලියන්න.

03. ශ්‍රී ලංකාව අයත්වන භූ තැටිය ලියා දක්වන්න

04. පෘථිවියේ භූ තැටි සෙමෙන් චලනය වීමට හේතුව කුමක්ද?

05. පෘථිවියේ ප්‍රධාන භූ තැටිවල පිහිටීම ලෝක ආකෘති සිතියමක ළකුණු කර නම් කරන්න.